# ජ වි පෙ හා විශ්වවිද්‍යාල දේශපාලනය

මෙරට දේශපාලන පක්ෂ ඇත්නම් ඒ කුඩා මාක්ස්වාදී ට්‍රොට්ස්කිවාදී පක්ෂ පමණ ය. ඒ පක්ෂවල කතාකරන විමධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදය කෙසේ වෙතත් දැඩි මධ්‍යගතභාවයක් ඇත. එවැනි පක්ෂයක වැදගත් වන්නේ දේශපාලන බල මණ්ඩලය හා මධ්‍යම කාරක සභාව ය. එහෙත් එහි අනෙක් සාමාජිකයෝ (එවැන්නන් විශාල පිරිසක් ඇතැයි මෙයින් නො කියැවෙයි.) බොහෝ විට දේශපාලන බල මණ්ඩලයේ හා මධ්‍යම කාරක සභාවේ තීරණවලට අවනත වෙති. යම් අයුරකින් එවැනි තීරණවලට අවනත වීමට නොහැක්කෝ වැඩිකල් නො හොස් ම පක්ෂය අත්හැර යති.

මේ කුඩා ට්‍රොට්ස්කිවාදී පක්ෂවලට වැරදි වුවත් ප්‍රතිපත්තියක් ඇත. පක්ෂයේ සාමාජික සියල්ලෝ යම් කාල පරිච්ඡේදයක දී ඒ ප්‍රතිපත්තිය විශ්වාස කරති. එහෙත් මේ පිළිගැනීම ඇත්තේ ටික දිනෙකට පමණකි. වැඩිකල් නොගොස් කිහිප දෙනෙක් පක්ෂය ප්‍රතිපත්ති අනුගමනය නොකරන්නේ යැයි කියමින් පක්ෂයෙන් අස්වෙති. පක්ෂයෙන් අස්වන්නෝ ඇතැම් විටෙක අළුත් පක්ෂයක් පිහිටුවා ගනිති. දැන් මේ ක්‍රියාදාමය එලෙස ම සිදු නොවන්නේ ඒ පක්ෂවලට අළුතෙන් බැඳෙන්නන්ගේ සංඛ්‍යාව ශූන්‍යයට ආසන්න වැවිනි. මේ පක්ෂ බොහොමයක ම සාමාජිකයන්ගේ සාමාන්‍ය වයස අවුරුදු පණහක් පමණ වේ යැයි සිතිය හැකි ය.

වත්මන් සන්දර්භයෙහි ට්‍රොට්ස්කිවාදී පක්ෂවලට තබා කිසිම මාක්ස්වාදී පක්ෂයකටවත් ලංකාවේ හෝ ලෝකයේ වෙනත් රටක හෝ එතරම් ආකර්ෂණයක් නැත. මාක්ස්වාදී පක්ෂවල සුළු වශයෙන් වුව ද ජාතිකත්වයක් පෙන්නුම් කෙරුණේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ දේශපාලන සංරචකය ප්‍රධාන වූ ඊනියා යටත්විජිත සමයෙහි ය. ඒ පක්ෂ තකල අධිරාජ්‍යවාදයට එරෙහිව කල සටන් ජාතිකත්වයක් මත කෙරුණු සටන් ලෙස ජනතාවගෙන් කොටසකට පෙනී ගියේ ය. එකල මාක්ස්වාදී පක්ෂවලට ආසියාවේ, අප්‍රිකාවේ හා දකුණු ඇමෙරිකාවේ රටවල ජනප්‍රියබවක් තිබුණේ එබැවිනි.

එසේ වුවත් මේ රටවල් නිදහස ලබාගැනීමෙන් පසු බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ දේශපාලන සංරචකය අභිබවා අනෙක් සංරචක ඉදිරියට එත්ම මාක්ස්වාදී පක්ෂවල ජනප්‍රියබව ක්‍රමයෙන් හීනවිය. විශේෂයෙන් ම ඒ ඒ රටවල ජාතිකත්වය මත පදනම් වූ දේශපාලන ව්‍යාපාර බිහිවත්ම මාක්ස්වාදී පක්ෂවලට වූ ආකර්ෂණය අඩුවන්නට විය. මේ ඇතැම් දේශපාලන ව්‍යාපාර මාක්ස්වාදයෙන් යම් යම් කරුණු ගත් බව ද රහසක් නො වේ. එවැනි ව්‍යාපාර ද ඇතැම් විට සමාජවාදයක් ගැන කතා කෙළේ ය. එහෙත් ඒ ව්‍යාපාර කිසි දිනෙක මාක්ස්වාදී ඊනියා පංති දෘෂ්ටියකින් පංති වෛරයකින් සමාජය විග්‍රහ නො කෙළේ ය. ඉන් අදහස් කරන්නේ ඒ දේශපාලන ව්‍යාපාර විසින් කිසිදිනෙක ධනපති පංතිය වැනි යෙදුම් භාවිතා නොකෙරුණු බව නො වේ. ධනපති පංතිය, පීඩිත ජනතාව, සමාජවාදය වැනි මාක්ස්වාදී වචන භාවිතා කෙරුණු ද මාක්ස්වාදී සංකල්ප ඒ වචනවලින් ප්‍රකාශ නො විණි.

ඉහත සඳහන් කරුණු ලංකාවේ ක්‍රියාත්මක වී ඇති ආකාරය ඉතා පැහැදිළි ය. සමසමාජ පක්ෂය අධිරාජ්‍ය විරෝධි පක්ෂයක් ලෙස කලක් සිංහල ගුරුවරුන්, වෛද්‍යවරුන් ආදී පිරිස් ද ආකර්ෂණය කිරීමට සමත් විය. ට්‍රොට්ස්කිවාදී සමසමාජ පක්ෂයට වඩා ජාතිකත්වයක් සුළුවෙන් වුව ද නිරූපණය කිරීමට ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය ලෙස 1943 දී සමසමාජ පක්ෂයෙන් බිඳී ගිය කණ්ඩායමට හැකි විය. වෙනත් රටවල මෙන් නොව ලංකාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය මාක්ස්වාදී යැයි කියන ප්‍රධාන දේශපාලන ධාරාව වුයේ මෙරට බ්‍රිතානි අධ්‍යාපනය විසින් ලෝකයේ බොහෝ රටවල බිහිවූ උගතුන්ට වඩා අනුකාරක මනස් ඇති උගතුන් බිහිකෙරී තිබුණු බැවිනි. බ්‍රිතානි අධ්‍යාපනය වඩාත් ම සාර්ථක වූ රටක් ලෙස ලංකාව හඳුනාගැනීමට හැකි ය.

ඒ කෙසේ වෙතත් නිදහස ලබාගැනීමෙන් පසුව සමසමාජ පක්ෂයටත් කොමියුනිස්ට් පක්ෂයටත් තිබූ ආකර්ෂණය අඩුවන්නට විය. 1951 දී බිහි වූ ශ්‍රී ල නි පක්ෂය 1954 දී පමණ ජාතිකත්ව මගක් ගැනීමත් සමග ඒ අඩුවීම තවත් තීව්‍ර විය. එහෙත් සමාජයෙන් ඈත්වී පොතේගුරු බ්‍රිතානි අධ්‍යාපනයක් ලැබූ පණ්ඩිතමානී තරුණයන්ට තවදුරටත් ඒ පක්ෂවල ආකර්ෂණයක් විය. විශේෂයෙන් ම ලංකා විශ්වවිද්‍යාලයීය තරුණයන් කෙරෙහි ඒ පක්ෂ දැඩි බලපෑමක් කෙළේ ය. සමාජයෙන් ඈත් ව සිටි බැවින් මේ තරුණයන්ට ලංකාවේ කම්කරු පංතියක් බෙහෙතකටවත් සොයා ගැනීමට නොහැකි බව අවබෝධ නො වි ය. එකල පේරාදෙණියේ ශිෂ්‍ය ව්‍යාපාරය සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂවල බූදලයක් විය. ඒ පක්ෂවල අනුගාමික සිසුහු ජන ජීවිතයෙන් වෙන් වී අයිවර් ජෙනිංග්ස්ගේ පේරාදෙණි ශාලාවල සුවපහසු ජීවිත

© Prof. Nalin De Silva

ගතකරන අතර කෑම දිරවීමට තමන්ට හරිහැටි නොතේරුණු ඊනියා අපෝහකය (දයලෙක්තිය), පංතිය, පංති සටන, සිවිල් යුද්ධය, බෝල්ෂෙවික් විප්ලවය ආදිය ගැන පණ්ඩිතමානී විවාදවල පටලැවුණහ. ඒ බොහෝ දෙනාගේ පංති සටන හා සිවිල් යුද්ධය උපාධි පරීක්ෂණයේ පංති සාමාර්ථයක් ලබාගැනීමට හා එකල තිබූ සිවිල් සේවයට ඇතුල්වීමට කරන ලද්දක් පමණක් විය.

හැටේ දශකයේ ලෝ පුරා ඇමරිකන් ආධිපත්‍යය පැතිරී යෑම ඇරඹිණි. ඇමරිකන් ආධිපත්‍යය පනහේ දශකයේ ඇතිවුව ද ලෝ පුරා පැතිරී යෑම ඇරඹුණේ හැටේ දශකයෙහි ය. ඒ සමග බ්‍රිතානි සංකල්පීය අධ්‍යාපනය ද තරමක් දෙදරීමට පටන් ගත්තේ ය. සංකල්පීය පිරිසිදු බව ගැන කරන ලද අවධානයට වඩා ප්‍රායෝගිකත්වය (ප්‍රැග්මැටිසම්) ඉදිරියට පැමිණියේ ය. එය මාක්ස්වාදී ව්‍යාපාරයට ද දැනෙන්නට විය. මාඕ සේතුං එවකටත් සංකල්පීය අච්චාරුවක් ව පැවති ස්ටැලින්වාදයට අභියෝග කෙළේ ය. ඔහුගේ මාක්ස්වාදී සංකල්පවලට ආසියාතික ජාතිකත්ව අදහස් ද මුසු විණි. මාක්ස්වාදී ට්‍රොට්ස්කිවාදය වෙනුවට ලෙනින් ස්ටැලින්වාදී විකෘතියක් නව මුහුණුවරකින් මාඕවාදය නමින් ආසියාවේ පැතිරෙන්නට විය. මාඕවාදය ද අවසන් විග්‍රහයේ දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඇමරිකන් පරිච්ඡේදයේ අංගයක් පමණක් විය.

ව්‍යාකරණය ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වූ වාග් විද්‍යාව, නිසඳැස් කව ප්‍රචලිතවීම, නව ගණිතය, ප්‍රායෝගික විද්‍යාව, විශ්වවිද්‍යාලවල කළමණාකාරණ පීඨ ප්‍රමුඛත්වයට පැමිණීම, විද්‍යා හා ශාස්ත්‍ර අධ්‍යාපනය සංකල්පීය දියාරුව සමග පල්ලම් බැසීම ආදිය ද මේ ඇමරිකන් පරිච්ඡේදයේ අංග පමණකි. වැඩේ කෙරෙන්නේ නම් සංකල්පීය පිරිසිදකම (කන්‍යාභාවය) කුමකට ද වැනි හැඟීමක් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇමරිකන් පරිච්ඡේදයෙහි වෙයි. තව තවත් කුඩා කරන විෂය වපසරියෙහි ඊනියා විශේෂඥයන් තව තවත් බිහිවීම, විෂය එකිනෙකින් වෙන්කිරීම, විශ්වවිද්‍යාලවල පීඨ අතර තිබූ ඒකග්‍රතාව නැතිවීම, නවකතාවට සමාජ විශ්ලේෂණයක් අනවශ්‍ය යන මතය පැතිරීම ආදිය ද මේ යුගයෙහි ලක්ෂණ වෙයි. මේ බටහිර ඇතමුන් කියන ආකාරයට ඊනියා පශ්චාත්නූතනත්වයක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ම ඇමරිකන් ආධිපත්‍යය යටතේ තවත් වර්ධනය වීමකි.

ජනතා විමුක්ති පෙරමුණ ලංකාවේ බිහිවූයේ ද එහි සාමාජිකයන් ඒ බව පිළිගැනීමට අකමැත්තක් දැක්වුව ද මේ ක්‍රිස්තියානි නූතනත්වයේ ඇමරිකන් ලක්ෂණ සහිතව ය. ඇතැම් මාක්ස්වාදී පක්ෂයක් හැරෙන්නට ලංකාවේ ඇත්තේ දේශපාලන පෙරමුණු මිස පක්ෂ නො වේ. එ ජා පක්ෂය මෙන් ම ශ්‍රී ල නි පක්ෂය ද පෙරමුණු වෙයි. ජනතා විමුක්ති පෙරමුණ ද නමින් පමණක් නොව ව්‍යූහයෙන් ද පෙරමුණක් වෙයි. එහි පංති සංකල්පය ජාතික සංකල්ප සමග මුසු වෙයි. කම්කරු පංතිය නිර්ධන පංතිය බවට පත්වෙයි. එය සමසමාජ හා පසුව බිහිවූ මාක්ස්වාදී ට්‍රොට්ස්කිවාදී පක්ෂවලට වඩා ඉතා ප්‍රායෝගික වෙයි. එහි ඊනියා න්‍යායාචාර්යවරුන් අත ක්වොන්ටම් භෞතිකය නිව්ටෝනීය භෞතිකයෙහි අංගයක් බවට පත්වෙයි.

ජ වි පෙ ඒ ඒ කාලවල කසිකබල් මාක්ස්වාදය හා ජාතිකවාදය අතර දෝලනය වෙයි. මාඕවාදී ව්‍යාපාරයක ඇති ගති ලක්ෂණ එහි වෙයි. විජේවීර මහතා ඒ ඒ කාලවල ලියූ ලිපි ලේඛන එකිනෙකින් වෙනස්වන්නේ ඉහත කී දෝලනය හේතුවෙනි. බලය ලබාගැනීම සඳහා ජාතිකත්වයට මාරුවන ජ වි පෙ සුළු බලයක් ලැබුණු පසු ඒ මග ගොස් තව තවත් බලය ලබාගනු වෙනුවට ඊනියා පංති දේශපාලනයට යළි අවතීර්ණ වී ලැබුණු බලය මුළුමනින් ම නැතිකර ගනියි. ඔවුන්ගේ ඊනියා දේශප්‍රේමය බලය ලබාගැනීම සඳහා වූ මගඩියක් බව කල් ගත වී වුව ද ජනතාවට වැටහෙයි. ශ්‍රී ල නි පක්ෂයෙහි ජාතිකත්වය වර්ධනය වන විට අනෙක් පක්ෂවලට ජාතිකත්වයේ කොඩිය ඉස්සීම අපහසු කටයුත්තක් වෙයි. අද ජ වි පෙට ඇත්තේ කිසිම සංකල්පීය දැනුමක් නැති හැඟීම හා ප්‍රායෝගිකත්වය මත පමණක් දේශපාලනයෙහි යෙදෙන විශ්වවිද්‍යාලයීය සිසුන් පිරිසක් පමණය. මේ සිසුන්ට ජෙනිංග්ස්ගේ සිසුන්ට මෙන් සංකල්ප පදනම් කරගනිමින් වාද විවාද කළ නො හැකි ය. ඔවුහු තමන්ට බලය නොමැති පීඨවල ඊනියා ධනපති පංතියක් දකිති. පංති වෛරය ඇතැම් විට පීඨ වෛරයක් බවට පත් වෙයි. ඔවුන් දන්නේ තම දේශපාලනයට විරුද්ධ සිසුන් වරප්‍රසාද ලත් ධනපති පංතියෙහි දරුවන් යැයි සලකමින් ඊනියා පංති (පීඨ) වෛරයකින් පහර දීමට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva